පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1978 -12- 15

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 9 දරන ජාතික නිවාස (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1978 දෙසැම්බර් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1978 අංක 9 දරන ජාතික නිවාස (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 75/78.

**ජාතික නිවාස පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

**1.** මේ පනත 1978 අංක 9 දරන ජාතික නිවාස (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

401 වන අධිකාරයෙහි 60අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** ජාතික නිවාස පනතේ 60 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 60අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"කොමසාරිස්වරයා සමග වූ ගිවිසුමක් යටතේ සන්තකය දරනු ලබන රජයේ ඉඩම්වල සන්තකය ආපසු ලබා ගැනීම.

60අ. (1) යම් තැනැත්තකු සහ කොමසාරිස්වරයා අතර වූ ගිවිසුමක් (එම ගිවිසුමට එළඹුණේ මේ වගන්තිය ක්‍රියාත්මකවීමට පෙර වුව ද පසුව වුව ද) අනුව ඒ තැනැත්තා යම් රජයේ ඉඩමක සන්තකය දරන්නා වූ ද, ඒ ඉඩම පිහිටා තිබෙන ප්‍රදේශය තුළ නිවාස ඉදි කිරීම සඳහා තමාට ඇති රජයේ ඉඩම් ප්‍රමාණය ගැන සලකන විට, ඒ ඉඩමෙහි සන්තකය ආපසු ලබා ගැනීම යෝග්‍ය බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නා වූ ද අවස්ථාවක, මේ පනතෙහි හෝ ඒ ගිවිසුමේ ඇතුළත් නියමවල හෝ කුමක් සඳහන් වී ඇත ද, කොමසාරිස්වරයා විසින් ඒ ගිවිසුමේ පාර්ශ්වකරුවන් වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් යවා, ඒ ගිවිසුම අවලංගු කළ හැකි අතර, ඒ අනුව ඒ ගිවිසුම අවසාන විය යුතු ය.

(2) (අ) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් ගිවිසුමක් අවලංගු කරනු ලබන අවස්ථාවක, ඔහු විසින්—

(i) ඒ ගිවිසුමෙහි පාර්ශ්වකරුවකු වන සෑම තැනැත්තකු ම විසින් ඒ ගිවිසුමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීමෙහි ලා නැත හොත් ඒ නියමයන් අනුව ක්‍රියා කරන්නේ යයි අදහස් කරමින් ගෙවන ලද සියලුම මුදල් ද, ඒ මුදල් ගෙවන ලද දිනයෙහි සිට ආපසු ගෙවනු ලබන දිනය තෙක් ඒ මුදල වෙනුවෙන් වර්ෂයකට සියයට හත බැගින් වූ පොලියක් ද ඒ තැනැත්තාට ආපසු ගෙවිය යුතු ය; තව ද

(ii) ඒ තැනැත්තා විසින් ඒ ඉඩමෙහි යම් වැඩි දියුණුකිරීම් කරනු ලැබ ඇත් නම් ඒ වෙනුවෙන් සාධාරණ වන්දියක් ලෙස කොමසාරිස්වරයා අදහස් කරන මුදලක් ඒ තැනැත්තා වෙත ගෙවන ලෙස නියම කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ නියමයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(3) යම් රජයේ ඉඩමකට අදාළ ගිවිසුමක් (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් ම හෝ සාමාන්‍යයෙන් හෝ බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් ඒ ඉඩමෙහි සන්තකය ලබා ගත හැකි ය.

(4) කොමසාරිස්වරයා සඳහා හෝ වෙනුවෙන් යම් ඉඩමක සන්තකය ලබා ගැනීමට (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ තැනැත්තකුට යම් බාධාවක් හෝ අවහිරයක් කිරීම නිසා හෝ කිරීමට ඉඩ ඇති නිසා ඒ ඉඩමෙහි සන්තකය ලබා ගැනීමට ඔහුට නොහැකි වන හෝ නොහැකි වේයැයි සැක ඇති වන හෝ අවස්ථාවක, ඒ ඉඩම පිහිටා තිබෙන ස්ථානය විෂයයෙහි අධිකරණ බලය තිබෙන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඔහු විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ විට, කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය ඒ තැනැත්තාට භාර දෙන ලෙස පිස්කල්වරයාට විධාන කරන අධිකරණ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කළ යුතු ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (4) වන උපවගන්තිය යටතේ පිස්කල්වරයා වෙත ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, පිස්කල්වරයා විසින් නොපමාව ම ඒ ආඥාව ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ ආඥාව ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය ගැන අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතු ය.

(6) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (4) වන උපවගන්තිය යටතේ පිස්කල්වරයා වෙත ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ ආඥාව සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ, ඒ ආඥාව වෙනස් කිරීමේ හෝ නිෂ්ප්‍රභ කිරීමේ අදහසින් යම් අධිකරණයක ගන්නා ලද හෝ ආරම්භ කිරීමට අදහස් කරනු ලබන හෝ යම් ක්‍රියාමාර්ග හේතු කොටගෙන ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම කිසිම ආකාරයකින් නතර නොකළ යුතු ය.

(7) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, ඒ ආඥාව අදාළ වන ඉඩමට ඇතුළු වීම සඳහා ද ඒ ඉඩමේ පදිංචි වී සිටින යම් තැනැත්තකු නෙරපීම සඳහා ද, කොමසාරිස්වරයා සඳහා සහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය ලබා ගැනීමට බලය දෙනු ලැබූ තැනැත්තාට ඒ ඉඩමේ සන්තකය භාර දීම සඳහා ද අවශ්‍ය විය හැකි බලය පිස්කල්වරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ පාවිච්චි කරනු ලැබිය හැකි ය.".